# පළාත් හා පළාත් අරමුදල් පිළිබඳව විගණන හා කළමනාකරණ කමිටුව

පර්සි සමරවීර ශ්‍රවණාගාරය - ඌව පළාත් සභාව

**2020.12.30 දින**

**පෙ.ව. 10.00 ට**

- මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති භාණ්ඩාගාර චක්‍රලේඛ මෙන්ම ඌව පළාත් ප්‍රධාන ලේකම්තුමන් විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ විධිවිධාන පරිදි ඌව පළාත් සභාවේ ආයතන මට්ටමින් විගණන හා කළමනාකරණ කමිටු පවත්වනු ලබයි.

පවතින වසංගත රෝග තත්ත්වය මත වුවද මෙම වසරේ විගණන හා කළමනාකරණ කමිටු සාකච්ඡා 151 ක පමණ ප්‍රමාණයක් පැවැත්වීමට හැකි වූ අතර මේ තුළින් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු මෙන්ම පළාත් පාලන ආයතන ඇතුළු කලාප කාර්යාල මට්ටමින් සැලකිය යුතු මට්ටමක කාර්ය සාධනයක් රඳවා ගැනීමට හැකියාව ලැබුණි.

මෙම කාර්යභාරය සාර්ථක කර ගැනීම සඳහා ඌව පළාතේ ප්‍රධාන ලේකම්තුමා ඇතුළු සියලුම ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ගණකාධිකාරීවරුන් ඇතුළු කාර්ය මණ්ඩලය ලබාදුන් සහය මෙන්ම ජාතික විගණනයේ හා පළාත් භාණ්ඩාගාරයේ නිරීක්ෂණ මට්ටමේ දායකත්වයද නොඅඩුව ලැබුණි.

# පළාත් හා පළාත් අරමුදල් පිළිබඳ කමිටු කටයුතු 2020.09.29 දින

**2020.09.29 දින ඌව පළාත් ප්‍රධාන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, සහකාර විගණකාධිපති (ඌව), විගණන අධිකාරීවරුන්ගේ (බදුල්ල/ මොණරාගල) සහභාගීත්වයෙන් පළාත් අරමුදල් පිළිබඳ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු රැස්වීම් ශාලාවේදී පවත්වන ලදී.**









මෙම කමිටු සාකච්ඡා වලදී ආයතනයකට අදාළ සියලුම පාලන පද්ධතීන් ආවරණය වන සේ පහත සඳහන් කරුණු සාකච්ඡාවට භාජනය කරයි.

මෙහිදී -

- කමිටු සාමාජිකයින් හා සහභාගීවන්නන් වෙත කමිටු රැස්වීමේදී බලාපොරොත්තු අරමුණු පිළිබඳව අවබෝධ කරලීම.
- අභ්‍යන්තර විගණනයේ කාර්යපථය, විගණන සැලැස්ම, විගණන විමසුම් පිළිබඳව සාකච්ඡා කිරීම.
- අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචනය සහ ඇගයීම.
- රාජ්‍ය විගණනයේ නිරීක්ෂණ හා විගණකාධිපති වාර්තාවල පෙන්වා දී ඇති කරුණු පිළිබඳව අවධානය යොමු කිරීම.
- රාජ්‍ය හා පළාත් මට්ටමින් ගිණුම් කාරක සභා නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සාකච්ඡා කිරීම.

- මූල්‍ය පාලනය හා ඉදිරිපත් කල යුතු මූල්‍ය ලියවිලි පිළිබඳව හා වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීමේ සූදානම පිළිබඳව සාකච්ඡා කිරීම.
- අයවැය පාලනය හා සමාලෝචනය.
- පිරිවැය සඵලතාවය, කාර්ය සාධනය හා ඉලක්ක සපුරා ගැනීම.
- වියදම් පරිපාලනය හා වියදම් කාර්යක්ෂමතාවය.
- ආදායම් පරිපාලනය.
- කළමනාකරණ ක්‍රියාවලිය, මෙහෙයුම් කාර්යක්ෂමතාවය, පාලන පද්ධති දුර්වලතා, අලාභහානි හා පාඩු පිළිබඳ ක්‍රියාවලිය.
- ව්‍යවස්ථාපිත හා වෙනත් නීති රීති සමාලෝචනය හා අභ්‍යන්තර, බාහිර චක්‍රලේඛ විධිවිධාන සඳහා අනුගත වීම.
- ක්‍රියාකාරී සැලසුම්, තිරසර අරමුණු, ප්‍රසම්පාදන සැලසුම් හා වෙනත් සැලසුම් හා එහි ප්‍රගතිය පිළිබඳව සමාලෝචනය.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත බලතල පවරා ඇති කාර්යභාරය මෙන්ම යොමු කර ඇති පළාත් සභා නිලධාරීන්ගේ කාර්ය සාධනය පිළිබඳව සාකච්ඡා කිරීම.
- විගණන හා කළමනාකරණ කමිටුවේ කාර්ය සාධනය පිළිබඳව සමාලෝචනය හා වාර්තා කිරීම.

# විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීම හා ක්‍රියාත්මක කිරීම

- පිහිටුවා ඇති විගණන කමිටු සංඛ්‍යාව - **84**

පසුගිය වර්ෂ කිහිපයක සිට මේ දක්වා විගණන කමිටු ක්‍රියාත්මක වීම

| වර්ෂය | පවත්වා ඇති කමිටු රැස්වීම් සංඛ්‍යාව |
|---|---|
| 2015 | 115 |
| 2016 | 130 |
| 2017 | 157 |
| 2018 | 225 |
| 2019 | 213 |
| 2020 | 151 |
| එකතුව | 991 |

# 2020 වර්ෂයේ මේ දක්වා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම්

| අනු අංකය | ආයතනය | 2020 වර්ෂය | | | |
|---|---|---|---|---|---|
| | | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව |
| | **01.** පළාත් අමාත්‍යාංශ | | | | |
| 1 | **1.** ක්‍රීඩා අමාත්‍යාංශය | 2020.03.11 | | 2020.08.19 | 2020.12.09 |
| | | | | 2020.09.22 | |
| 2 | **2.**කෘෂිකර්ම අමාත්‍යාංශය | 2020.02.25 | | 2020.07.22 | 2020.12.23 |
| | | | | 2020.09.23 | |
| 3 | **3.**මාර්ග අමාත්‍යාංශය | 2020.02.26 | | 2020.07.22 | 2020.12.02 |
| | | | | 2020.09.23 | |
| 4 | **4.** අධ්‍යාපන අමාත්‍යාංශය | | | 2020.07.09 | 2020.12.21 |
| | | | | 2020.09.23 | |
| 5 | **5.**සෞඛ්‍ය අමාත්‍යාංශය | 2020.02.27 | | 2020.07.31 | 2020.12.15 |
| | | | | 2020.09.23 | |
| | **02.** නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාල | | | | |
| 6 | **1.** නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) කාර්යාලය | 2020.02.25 | | 2020.09.11 | 2020.11.24 |
| 7 | **2.** නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) කාර්යාලය | | | | 2020.10.14 |
| 8 | **3.** නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය | 2020.02.26 | | 2020.09.22 | 2020.12.02 |
| 9 | **4.** නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) කාර්යාලය | | | 2020.08.26 | 2020.10.19 |
| | | | | | 2020.11.24 |
| 10 | **5.** නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය | | | | 2020.10.19 |
| | **03.** අමාත්‍යාංශ යටතට නොගැනෙන ආයතනයන් | | | | |
| 11 | **1.** ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය | | | 2020.08.19 | 2020.12.23 |
| 12 | **2.** ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 2020.03.04 | | 2020.08.13 | 2020.12.22 |
| 13 | **3.** ඌව පළාතේ සභා ලේකම් කාර්යාලය | | | 2020.09.23 | 2020.12.28 |
| 14 | **4.** ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව | | | 2020.08.13 | |
| | **04.** පළාත් දෙපාර්තමේන්තු | | | | |
| 15 | **1.**අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 2020.02.28 | | 2020.08.25 | 2020.12.09 |
| | | | | 2020.09.23 | 2020.12.21 |
| 16 | **2.**ආදායම් දෙපාර්තමේන්තුව | | | 2020.07.09 | 2020.10.29 |
| | | | | 2020.09.23 | 2020.12.21 |
| 17 | **3.**ආයුර්වේද දෙපාර්තමේන්තුව | 2020.02.27 | | 2020.07.31 | 2020.12.15 |
| | | | | 2020.09.23 | |

| අනු අංකය | ආයතනය | 2020 වර්ෂය | | | |
|---|---|---|---|---|---|
| | | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව |
| 18 | **4.**ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව | | | 2020.07.09 | 2020.12.21 |
| | | | | 2020.09.23 | |
| 19 | **5.**ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | | | | |
| 20 | **6.**ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | | | 2020.07.09 | 2020.12.21 |
| | | | | 2020.09.23 | |
| 21 | **7.**කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | 2020.03.11 | | 2020.08.19 | 2020.12.09 |
| | | | | 2020.09.22 | |
| 22 | **8.**අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව | | | 2020.09.22 | |
| 23 | **9.**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 2020.02.25 | | 2020.07.22 | 2020.12.23 |
| | | | | 2020.09.23 | |
| 24 | **10.**මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව | 2020.02.26 | | 2020.07.22 | 2020.11.25 |
| | | | | 2020.09.23 | |
| 25 | **11.**පළාත් පාලන දෙපාර්තමේන්තුව | 2020.03.10 | | | 2020.10.09 |
| | | | | | 2020.12.21 |
| | | | | | 2020.12.28 |
| 26 | **12.**පරිවාස හා ළමා ආරක්ෂක දෙපාර්තමේන්තුව | 2020.02.27 | | 2020.07.31 | 2020.12.15 |
| | | | | 2020.09.23 | |
| 27 | **13.**සමුපාකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | 2020.02.26 | | 2020.07.22 | 2020.12.02 |
| | | | | 2020.09.23 | |
| 28 | **14.**පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | 2020.02.26 | | 2020.07.31 | 2020.12.15 |
| | | | | 2020.09.23 | |
| 29 | **15.**සත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුව | 2020.02.25 | | 2020.07.22 | 2020.12.23 |
| | | | | 2020.09.23 | |
| 30 | **16.**සමාජ සේවා දෙපාර්තමේන්තුව | 2020.02.27 | | 2020.07.31 | 2020.12.15 |
| | | | | 2020.09.23 | |
| 31 | **17.**වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 2020.02.25 | | 2020.07.22 | 2020.12.23 |
| | | | | 2020.09.23 | |
| 32 | **18.** ක්‍රීඩා දෙපාර්තමේන්තුව | 2020.03.11 | | 2020.08.19 | 2020.12.09 |
| | | | | 2020.09.22 | |
| | **05.** ආයතන (වෙනත්) | | | | |
| 33 | **1.**ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ- මොණරාගල | 2020.02.27 | | 2020.07.31 | 2020.12.15 |
| | | | | 2020.09.23 | |
| 34 | **2.**ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ- බදුල්ල | 2020.02.27 | | 2020.07.31 | 2020.12.15 |
| | | | | 2020.09.23 | |
| 35 | **3.**පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ කාර්යාලය (කහගොල්ල) | | | | |
| 36 | **4.**පැල්ගහතැන්න කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානය | | | | |

| අනු අංකය | ආයතනය | 2020 වර්ෂය | | | |
|---|---|---|---|---|---|
| | | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව |
| 37 | 5.නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය-බදුල්ල | 2020.02.27 | | 2020.07.22 | |
| | | | | 2020.09.23 | |
| 38 | 6.නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය-මොණරාගල | 2020.02.27 | | 2020.07.22 | |
| | | | | 2020.09.23 | |
| 39 | 7.පුස්තකාල සේවා මණ්ඩලය | | | 2020.07.09 | |
| | | | | 2020.09.23 | |
| | 06.මූලික රෝහල් | | | | |
| 40 | 1.දියතලාව | | | | |
| 41 | 2.මහියංගනය | | | | |
| 42 | 3.වැලිමඩ | | | | |
| 43 | 4.සියඹලාණ්ඩුව | | | | |
| 44 | 5.බිබිල | | | | |
| 45 | 6.වැල්ලවාය | | | | |
| | 07.කලාප අධ්‍යාපන කාර්යාල | | | | |
| 46 | 1.බදුල්ල | 2020.01.28 | | 2020.08.25 | |
| 47 | 2.බණ්ඩාරවෙල | 2020.01.28 | | 2020.08.25 | 2020.10.20 |
| 48 | 3.බිබිල | 2020.01.17 | | 2020.08.20 | |
| | | | | 2020.08.25 | |
| 49 | 4.මහියංගන | 2020.01.28 | | 2020.08.25 | |
| 50 | 5.පස්සර | 2020.01.28 | | 2020.08.25 | |
| 51 | 6.වැලිමඩ | 2020.01.28 | | 2020.08.25 | |
| 52 | 7.වැල්ලවාය | 2020.01.17 | | 2020.08.20 | |
| | | | | 2020.08.25 | |
| 53 | 8.මොණරාගල | 2020.01.17 | | 2020.08.20 | |
| | | | | 2020.08.25 | |
| 54 | 9.වියලුව | 2020.01.28 | | 2020.08.25 | |
| 55 | 10.තණමල්විල | 2020.01.17 | | 2020.08.20 | |
| | | | | 2020.08.25 | |
| | 08.නගර සභා | | | | |
| 56 | 1.බදුල්ල | | | 2020.07.31 | |
| 57 | 2.බණ්ඩාරවෙල | | | | |
| 58 | 3.හපුතලේ | | | | |

| අනු අංකය | ආයතනය | 2020 වර්ෂය | | | |
|---|---|---|---|---|---|
| | | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව |
| | **09.**ප්‍රාදේශිය සභා | | | | |
| 59 | **1.**බදුල්ල | | | | |
| 60 | **2.**බඩල්කුඹුර | | | 2020.08.27 | |
| 61 | **3.**බණ්ඩාරවෙල | | | | |
| 62 | **4.**බිබිල | | | 2020.08.27 | |
| 63 | **5.**බුත්තල | | | 2020.08.27 | |
| 64 | **6.**ඇල්ල | | | | |
| 65 | **7.**හල්දුම්මුල්ල | | | | |
| 66 | **8.**හාලිඇල | | | | |
| 67 | **9.**හපුතලේ | | | | |
| 68 | **10.** කන්දකැටිය | | | | |
| 69 | **11.**කතරගම | 2020.01.31 | | 2020.08.27 | |
| 70 | **12.**ලුණුගල | | | | |
| 71 | **13.**මඩුල්ල | | | 2020.08.27 | |
| 72 | **14.**මහියංගනය | | | | |
| 73 | **15.**මැදගම | | | 2020.08.27 | |
| 74 | **16.**මීගහකිවුල | | | | |
| 75 | **17.**මොණරාගල | 2020.02.20 | | 2020.08.27 | |
| 76 | **18.**පස්සර | | | | |
| 77 | **19.**රිදීමාලියද්ද | | | | |
| 78 | **20.**සියඹලාණ්ඩුව | | | 2020.08.27 | |
| 79 | **21.**සොරණාතොට | | | | |
| 80 | **22.**තණමල්විල | | | 2020.08.27 | |
| 81 | **23.**ඌව පරණගම | | | | |
| 82 | **24.**වැල්ලවාය | 2020.02.27 | | 2020.08.27 | |
| 83 | **25.**වැලිමඩ | | | | |
| | | | | | |
| 84 | **01.** පළාත් විගණන හා කළමනාකරණ කමිටුව | | | **2020.09.29** | |

# අභ්‍යන්තර විගණනයේ ක්‍රියාකාරිත්වය

පසුගිය වර්ෂ කිහිපය තුළ දෙපාර්තමේන්තුව සතු අවම සම්පත් උපයෝගී කරගනිමින් සැලකිය යුතු විගණන පරීක්ෂණ සංඛ්‍යාවක් සිදු කිරීමේ හැකියාව ලැබුණු අතර වසංගත රෝග තත්ත්වයක් මත වුවද ක්ෂේත්‍රයේ ගැටළුකාරී තත්ත්වයන් පැවතුනද මූලාස විගණන ක්‍රියාවලියක් මෙන්ම පසු විපරම් විගණන පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කරන ලදී.

| වර්ෂය | සිදුකළ විගණන පරීක්ෂණ සංඛ්‍යාව |
|---|---|
| 2015 | 210 |
| 2016 | 251 |
| 2017 | 352 |
| 2018 | 313 |
| 2019 | 334 |
| 2020 මේ දක්වා | 140 |
| එකතුව | 1600 |

- ප්‍රමාණාත්මකභාවය පිළිබඳව විවිධ අවස්ථාවල විවිධ පාර්ශවයන්ගෙන් විවිධ අදහස් පැවතුනද කළමනාකරණ, කාර්ය සාධන, පාරිසරික, මුදලට අගය, වැනි සංකල්ප අදාළ කරගනිමින් විවිධ ක්ෂේත්‍රයන් තුළ සාර්ථක අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමේ හැකියාව ලැබුණි. එසේම මෙම විමසුම් පිළිබඳව පසුගිය විගණන හා කළමනාකරණ කමිටු වලදී සිදු කල සාකච්ඡා මෙන්ම ලබාදුන් තීරණ මත එම ක්ෂේත්‍රයන් වර්තමානයේ යහපත් මට්ටමකින් පැවතීම මෙම ක්‍රියාවලියේ සාර්ථකත්වයට තහවුරුවක් බව පෙන්වා දෙමි.

# ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම් හා ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍යාංශය

- අධ්‍යාපන ක්ෂේත්‍රය

| නිරීක්ෂණය වූ තත්ත්වය | වර්තමාන නිරීක්ෂණ |
|---|---|
| විවිධ ව්‍යාපෘති මඟින් ඉදිකරන ලද පාසල් ගොඩනැගිලි ඌන උපයෝජනය සහ නඩත්තු නොකිරීම. | විදුහල්පතිවරුන් වෙත වගකීම් පවරා තිබීම හා කලාප කාර්යාල මට්ටමේ අධීක්ෂණ කටයුතු සිදු කිරීම. |
| | සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද තුළ අත්‍යවශ්‍ය දුරස්ථභාවය රඳවා ගැනීම පිණිස නව ගොඩනැගිලි භාවිතා කිරීම. |
| | වැසිකිළි සඳහා අවශ්‍ය ජල පහසුකම් ප්‍රමාණවත් නොවන තත්ත්වයක් සැලකිය යුතු පාසල් සංඛ්‍යාවක නිරීක්ෂණය වන බැවින් ඒ පිළිබඳව අවධානය යොමු විය යුතුය. |

- සම්පත් ඌණ උපයෝජනය යටතේ පෙන්වා දුන් බ/ හල්දුම්මුල්ල දෙමල විද්‍යාලයේ ඉදිකළ දින සිට අභාවිතව පැවති වැසිකිළි ඒකකය මේ වන විට භාවිතයට ගෙන ඇත. මෙහි ඉදිකිරීම් කටයුතු සිදුකරන අවස්ථාවේදීම එම වැඩබිම් පරීක්ෂා කොට බලා පවතින අඩුපාඩු පෙන්වා දෙන ලදි.

**පෙර පැවති තත්වය**









**වත්මන් තත්වය**







| නිරීක්ෂණය වූ තත්ත්වය | වර්තමාන නිරීක්ෂණ |
|---|---|
| පාසල් අධීක්ෂණය | වර්තමානයේ අදාළ අධීක්ෂණ කණ්ඩායම් විසින් පාසල් පරිපාලනය නියමිත ආයතන පරිපාලනය මෙන්ම අධ්‍යාපන සංවර්ධන කටයුතු හා වත්කම් පරිපාලනය සිදු කරන බවට බර තැබීම් ක්‍රමයක් හඳුන්වා දී පාසල වෙත ලකුණු ලබාදීමේ ක්‍රමවේදයක් ආරම්භ කර ඇත. මේ පිළිබඳව කලාප කාර්යාලයන් සෘජුවම අධීක්ෂණ කටයුතු සිදු කරනු ලැබේ. |

## ❑ පළාත් පාලන ක්ෂේත්‍රය

| නිරීක්ෂණය වූ තත්ත්වය | වර්තමාන නිරීක්ෂණ |
|---|---|
| ආදායම් කළමනාකරණය | රු. මිලියන 310 කට අධික හිඟ ආදායම් අයකර ගැනීම සම්බන්ධව පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන අධීක්ෂණ වැඩපිළිවෙල මත ප්‍රතිශතාත්මක වෙනසක් දිස්ත්‍රික්ක තුළ නිරීක්ෂණය වේ. |

| | පැවති ප්‍රතිශතය | වර්ථමාන ප්‍රතිශතය |
|---|---|---|
| බදුල්ල | 20% - 40% | 55% - 70% |
| මොණරාගල | 30% - 50% | 50% - 75% |

තවදුරටත් අධීක්ෂණ කටයුතු සිදුවිය යුතුය.

## ඉඩම් ක්ෂේත්‍රය

| නිරීක්ෂණය වූ තත්ත්වය | වර්තමාන නිරීක්ෂණ |
|---|---|
| හිඟ ඉඩම් ආදායම දළ වශයෙන් රු. මිලියන 52 | ඉඩම් බදු නොගෙවීම මත නඩු පැවරීමේ බලතල පිළිබඳව ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත අවධානය යොමු කර ඇති අතර එම බලතල මධ්‍යම රජයේ ඉඩම් රෙජිස්ට්‍රාර් සතුව පැවතීම මත සාකච්ඡා වට කිහිපයක්ම සිදු කිරීම. |

## ආදායම් ක්ෂේත්‍රය

| නිරීක්ෂණය වූ තත්ත්වය | වර්තමාන නිරීක්ෂණ |
|---|---|
| පළාත් සභා විෂය යටතේ ඇති ආදායම් විෂයයන් සක්‍රීය කරවීම. | විෂයයන් කිහිපයක් යටතේ ප්‍රඥප්ති සකස් කර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු වෙමින් පවතී. |

# උෘව පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක, වනිතා කටයුතු සහ සමාජ සුභසාධන අමාත්‍යාංශය

| නිරීක්ෂණය වූ තත්ත්වය | වර්තමාන නිරීක්ෂණ |
| --- | --- |
| ඖෂධ පරිපාලනය | සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මේ වන විට පවතින අධික රාජකාරීන් හේතු කොට යම් ප්‍රමාණයකින් කල් ඉකුත් වූ ඖෂධ අපහරණය කිරීම් වැනි තත්ත්වයන් නිරීක්ෂණය වේ. |

| නිරීක්ෂණය වූ තත්ත්වය | වර්තමාන නිරීක්ෂණ |
| --- | --- |
| සෞඛ්‍ය උපකරණ, ද්‍රව්‍ය භාවිතය හා නඩත්තු කිරීම | සැලකිය යුතු මට්ටමකින් පෙන්වා දුන් තත්ත්වයන් මඟහරවා ගැනීමට වගකිව යුතු පාර්ශවයන් කටයුතු කර ඇති බවක් නිරීක්ෂණය වේ. |

1. <u>බඩල්කුඹුර ප්‍රාදේශීය රෝහල</u>
<u>මුල් විගණන අවස්ථාව.</u>

➢ 2017/01/06 දින මෙම රෝහල සඳහා ලබාදී තිබූ රු. 543,900.00 ක මුදලක් වටිනා ජෙනරේටරයක් ලබාදී තිබූ අතර නිෂ්ප්‍රයෝජනවත්ව වසර දෙකකට ආසන්න කාලයක් පවතින බව විගණනය විසින් වාර්තා කරන ලදී.




ඒ වන විට මෙම රෝහලේ විදුලිය නොමැති විට විදුලි පහසුකම් සපයා ගත හැකි වෙනත් ක්‍රමවේදයක් සකස් කර නොතිබූ අතර හදිසි විදුලි ලාම්පුද ක්‍රියාත්මක නොවීම මත මෙම රෝහලේ වාට්ටු 04 සඳහා විදුලිය නොමැතිවූ විට චිමිනි ලාම්පු භාවිතා වී තිබුණි.





<u>මෙම තත්ත්වය පෙන්වාදීමෙන් පසු</u>

➢ 50 KVA ජෙනරේටරයක් මෙම රෝහල වෙත ලබාදීමට කටයුතු කරනු ලැබීය.



මෙයද ප්‍රයෝජනයට නොගෙන ආවරණයක් හෝ නොමැතිව පවතින බව පසු විපරම් විගණනයෙන් පෙන්වා දෙන ලදී.

## පසුගිය පළාත් කමිටු අවස්ථාවේ පැවති තත්ත්වය





මේ අවස්ථාව වන විට ජෙනරේටරය සඳහා ආවරණයක් සකසා පැවති අතර විදුලි සැපයීමට අවශ්‍ය වයර් ඇදීම සිදුකර තිබුණද එමඟින් විදුලිය සපයා ගැනීමට අවශ්‍ය කටයුතු යොදා නොතිබුණි.

## <u>වර්තමාන තත්ත්වය</u> පසු විපරම් විගණන පරීක්ෂණය - අවි/39/2020/22 - 2020.12.24



මේ වන විට මෙම ජෙනරේටරයෙන් විදුලිය නොමැති අවස්ථා වල විදුලිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර පවතින බව නිරීක්ෂණය විය.

# ඌව පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන, මිරිදිය ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

- ක්ෂේත්‍ර විගණන පරීක්ෂණ

| නිරීක්ෂණය වූ තත්ත්වය | වර්තමාන නිරීක්ෂණ |
|---|---|
| බිබිල දිස්ත්‍රික් ගොවි පුහුණු මධ්‍යස්ථානයේ නිල නිවස ඉදිකිරීම.<br><br>• වැඩ අතරමග ඇණ හිටීම. | වර්තමානයේ ඇස්තමේන්තු වැඩ කොටස් වලින් 90% කට ආසන්න ප්‍රමාණය වැඩ නිම කර ඇති බව පසු විපරම් පරීක්ෂණයේදී නිරීක්ෂණය වේ. |







| නිරීක්ෂණය වූ තත්ත්වය | වර්තමාන නිරීක්ෂණ |
| --- | --- |
| ඔක්කම්පිටිය පාරිභෝගික වී අලෙවිය<br><br>• පාරිභෝගික වී අලෙවි නොකොට නිස්කාර්යයව පැවතීම. | වර්තමානයේ ප්‍රසම්පාදන ගැටළු මතු වූවත් මේ වන විට වී අලෙවි මණ්ඩලය වෙත ලබාදී ඇත. |







# ❑ වාරිමාර්ග ක්ෂේත්‍රය

| නිරීක්ෂණය වූ තත්ත්වය | වර්තමාන නිරීක්ෂණ |
|---|---|
| ඇල මාර්ග නඩත්තු නොකිරීම. | වර්තමානයේ අදාළ ගොවි සමිති සමඟ සාකච්ඡා කර ඇල මාර්ග නඩත්තු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක වේ. දෙපාර්තමේන්තුව විසින් ඍජුවම අධීක්ෂණ කටයුතු සිදු කරයි. |





## ❑ කෘෂිකර්ම ක්ෂේත්‍රය

| නිරීක්ෂණය වූ තත්ත්වය | වර්තමාන නිරීක්ෂණ |
|---|---|
| ගොවි ජනතාව වෙත ලබා දිය යුතු භාණ්ඩ බෙදා නොහැරීම. | සියලුම ද්‍රව්‍ය ගොවි ජනතාව වෙත බෙදා දී අවසන් කර ඇත. |




# ඌව පළාත් මාර්ග සංවර්ධන, නිවාස, ජල සම්පාදන, වතු යටිතල පහසුකම් සහ සමුපකාර කටයුතු අමාත්‍යාංශය

## ❑ මාර්ග ක්ෂේත්‍රය

| නිරීක්ෂණය වූ තත්ත්වය | වර්තමාන නීරීක්ෂණ |
|---|---|
| කොන්ත්‍රාත්කරුවන්ගේ අඩුපාඩු මෙන්ම නිසි නඩත්තුවක් නොමැති බැවින් මාර්ගයේ අනාරක්ෂිත බවක් නිර්මාණය වීම. | වර්තමාන පසු විපරම් අවස්ථාවේ මෙම අලුත්වැඩියාව සිදු කර අවසන් කර තිබීම තුළින් අනාරක්ෂිත බව ඉවත් වී ඇත. |

හීල් ඔය - කුරුඳුගොල්ල මාර්ගය








| නිරීක්ෂණය වූ තත්ත්වය | වර්තමාන නිරීක්ෂණ |
|---|---|
| විවිධ ව්‍යාපෘති සඳහා කැණීම් කරන ලද මාර්ග නැවත සකස් කර ගැනීමේ අවශ්‍යතාවය | තැන්පත් මුදල් ලබාගෙන අදාළ කොටස් අලුත්වැඩියා කර ඇත. |





කිතල් ඇල්ල මාර්ගය

## ❑ සමුපකාර ක්ෂේත්‍රය

| නිරීක්ෂණය වූ තත්ත්වය | වර්තමාන නිරීක්ෂණ |
|---|---|
| වෙල්ලස්ස සහල් සැකසුම් මධ්‍යස්ථානයේ කටයුතු නිෂ්කාර්යව පැවතීම. | වර්තමානයේ වී අලෙවි මණ්ඩලය වැනි ආයතන සමඟ සාකච්ඡා කර මේ සඳහා විසඳුම් ලබා ගැනීමට වර්තමාන පරිපාලනය කටයුතු කිරීම. |





# උෟව පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික, සහ පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශය

## ❑ ක්‍රීඩා ක්ෂේත්‍රය

| නිරීක්ෂණය වූ තත්ත්වය | වර්තමාන නිරීක්ෂණ |
|---|---|
| ප්‍රාදේශීය ලේකම් මට්ටමින් ලබා දී ඇති ක්‍රීඩා උපකරණ සමීක්ෂණය නොවීම සහ ලේඛනගත නොකිරීම. | මේ වන විට අදාළ සමීක්ෂණ කටයුතු සිදු කර ලේඛන ගත කර ඇති තත්ත්වයක් නිරීක්ෂණය වේ. |

## ❑ සංචාරක ක්ෂේත්‍රය

| නිරීක්ෂණය වූ තත්ත්වය | වර්තමාන නිරීක්ෂණ |
|---|---|
| සංචාරක සුව පහසු මධ්‍යස්ථාන | මෙම මධ්‍යස්ථාන වල කටයුතු සක්‍රීය කිරීමට පවතිව වසංගත තත්ත්වය හේතු වී ඇති බව නිරීක්ෂණය වේ. |

මෙම වර්ෂයේ විගණන කටයුතු වලදී මෙන්ම විගණන හා කළමනාකරණ කමිටු වලදී අභ්‍යන්තර විගණනයේ කරුණු ඉදිරිපත් කිරීම් වලදී සිදු කල අවධානම් ක්ෂේත්‍රයන් මෙන්ම පාලන පද්ධති වැඩි දියුණු කිරීමේ අවධානම් පවතින ක්ෂේත්‍රයන්

1. කලාප අධ්‍යාපන කාර්යාල මට්ටමින් ගුරුභවතුන් හා වෙනත් නිලධාරීන් හා සේවකයින් වෙත ලබා දී ඇති සේවක ණය සම්පූර්ණයෙන් අයකිරීමේ ගැටලු සහිත බවක් පෙන්වා දුනි. මෙහිදී සැසඳුම් වාර්තා වල ශේෂයන් නිවැරදි ලෙස ඉදිරියට ගෙනවිත් නොමැත.

   උදා - මූල්‍ය විගණන වාර්තා

   i. බණ්ඩාරවෙල කලාපය - රු. 3,318,047.00
   ii. වැලිමඩ කලාපය - රු. 2,953,324.00

2. ගෙවිය යුතු හිඟ වැටුප් සැලකිය යුතු මට්ටමින් පැවතීම හා අදාළ ගණනය කිරීම් නිවැරදි නොවීම.
3. කොන්ත්‍රාත් පදනම මත නැවත සේවය සඳහා යොමු වීමේදී චක්‍රලේඛ වැරදි ලෙස අර්ථකථනය කර ගනිමින් වැටුප් සකස් වී ඇති බවත් එම මුදල් සම්පූර්ණයෙන්ම ආපසු අයකර ගැනීමේ අවශ්‍යතාවය.
4. සෞඛ්‍ය කාර්ය මණ්ඩලය වෙත අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීම සඳහා ඉදිරිපත් කරන අතිකාල ඉල්ලීම් නිවැරදි ලෙස සිදු කල ගණනය කිරීමක් නොවීම.
5. ඌව පළාත් සභාවේ ගරු සභාපති තුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය වෙනුවෙන් සිදු කර ඇති ගෙවීම් නිවැරදි චක්‍රලේඛ සඳහා අවධානය යොමු නොවූ ගෙවීම් වශයෙන් නිරීක්ෂණය වීම.
6. මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරන පළාත් සභා සතු මාර්ග සංවර්ධනයේදී " අයිරෝඩ් " ව්‍යාපෘතියේ ක්‍රියාත්මක වීමේ ප්‍රමාදය හේතුවෙන් ගමනා ගමනය සම්බන්ධ ඉදිරියේදී ඇතිවන දුෂ්කරතා.

# අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ඉදිරි සැලසුම්

මේ වන විට ඌව පළාත් ප්‍රධාන ලේකම්තුමාගේ මැදිහත්වීමෙන් සියලුම ලේකම්වරු සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේද මැදිහත් වීම තුළින් පළාත් රාජ්‍ය සේවා කොමිසම මඟින් අභ්‍යන්තර විගණන නිලධාරීන් ලබාදී නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය මඟින් පුහුණු වැඩසටහනක්ද පවත්වා ඇත. ඒ අනුව ඉදිරි විගණන කටයුතු සඳහා ආයතන මට්ටමින් විගණන නිලධාරීන් යොමු කර ඇත. කෙසේ වෙතත් ඌව පළාත් සභා පරිපාලනයට යටත් සෑම ආයතනයකටම විගණනය මඟින් සිදු කරන සොයා බැලීම අත්‍යවශ්‍ය වන බැවින් එක් නිලධාරියෙකුට සැලකිය යුතු ආයතන සංඛ්‍යාවක විගණන වගකීම් පවරා දී තිබේ. නමුත් කාලය සහ පිරිවැය පිළිබඳව යම් යම් ගැටලු පැවතුනත් හැකි ප්‍රමාණයකින් කළමනාකරණය වෙත සහාය වීමක් ඉදිරි වර්ෂයේදී අපේක්ෂා කරමි.

ඒ අනුව පහත සඳහන් පරිදි විගණන පරීක්ෂණ සිදු කිරීම අපේක්ෂා කරමි.

| | |
|---|---|
| අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින ආයතන | 75 |
| සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින ආයතන | 25 |
| මාර්ග අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින ආයතන | 15 |
| කෘෂිකර්ම අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින ආයතන | 15 |
| ක්‍රීඩා අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින ආයතන | 15 |
| අනෙකුත් ආයතන | 25 |
| පසු විපරම් විශේෂ පරීක්ෂණ | 30 |
| එකතුව | 200 |

# විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම - 2021 වර්ෂය

| | | |
|---|---|---|
| 1. අධ්‍යාපන අමාත්‍යාංශය | - | 04 |
| 2. සෞඛ්‍ය අමාත්‍යාංශය | - | 04 |
| 3. කෘෂිකර්ම අමාත්‍යාංශය | - | 04 |
| 4. මාර්ග අමාත්‍යාංශය | - | 04 |
| 5. ක්‍රීඩා අමාත්‍යාංශය | - | 04 |
| 6. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාල | - | 20 |
| 7. සියලුම දෙපාර්තමේන්තු | - | 60 |
| 8. අනෙකුත් ආයතන | - | 30 |
| 9. පළාත් පාලන ආයතන | - | 116 |
| 10. කලාප අධ්‍යාපන කාර්යාල | - | 34 |
| 11. පළාත් කමිටු | - | 03 |
| එකතුව | - | 280 |

**මේ අනුව පළාත් කමිටු සැලකිය යුතු කාර්යභාරයක් ඉදිරි වර්ෂයේදී සැලසුම් කර ඇති බැවින් සියලුම දෙනාගේ සහාය ඉල්ලා සිටින අතර අධික රාජකාරීන් මත යම් මගහැරීමක් සිදුවන්නේ නම් ඒ පිළිබඳව අඩු තක්සේරුවක් නොකොට ඉදිරි කටයුතු සඳහා නව වර්ෂයේදී සහාය වෙන මෙන් ඉල්ලා සිටිමි.**

# පසුගිය ප්‍රගති සමාලෝචන සාකච්ඡාවේ අවධානයට යොමු කල කරුණු සම්බන්ධව සහ මෙම කමිටුවේදී අවධානයට යොමු කල යුතු කරුණු සම්බන්ධව අදහස් දැක්වීම

1. ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම් හා ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍යාංශය

2. ඌව පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක, වනිතා කටයුතු සහ සමාජ සුභසාධන අමාත්‍යාංශය

3. ඌව පළාත් මාර්ග සංවර්ධන, නිවාස, ජල සම්පාදන, වතු යටිතල පහසුකම් සහ සමුපකාර කටයුතු අමාත්‍යාංශය

4. ඌව පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන, මිරිදිය ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

5. ඌව පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික සහ ජේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශය

පසුගිය ප්‍රගති සමාලෝචන සාකච්ඡාවේ අවධානයට යොමු කල කරුණු සම්බන්ධව සහ මෙම කමිටුවේදී අවධානයට යොමු කල යුතු කරුණු සම්බන්ධව අනෙකුත් ආයතන වල අදහස් දැක්වීම

# ජාතික විගණනයේ අදහස් දැක්වීම

1. විගණන අධිකාරී, ඌව පළාත් සභාව (බදුල්ල)

2. විගණන අධිකාරී, පැරණි කච්චේරි සංකීර්ණය (බදුල්ල)

3. විගණන අධිකාරී (මොණරාගල)

4. විගණන අධිකාරී, මහ නගර සභාව, බදුල්ල (පළාත් පාලන)

5. විගණන අධිකාරී, මොණරාගල (ව්‍යාපෘති)

# පළාත් භාණ්ඩාගාරයේ අදහස් දැක්වීම

1. පළාත් සහා අරමුදල්
2. ගිණුම් ඉදිරිපත් කිරීම
3. වියදම් හා ආදායම් කළමනාකරණය
4. වත්කම් පරිපාලනය

# කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම

# උගව පළාත් සහකාර විගණකාධිපතිතුමන්ගේ අදහස් දැක්වීම

# ඌව පළාත් ප්‍රධාන ලේකම්තුමාගේ අදහස් දැක්වීම සහ පළාත් කම්ටු කටයුතු පිළිබඳව සමාලෝචනය

# ස්තූතියි..!